මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය (TNSWSP)**

# පුරප්පාඩු නිවේදනය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, කැපවූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් හරහා වෙළඳ ජාතික තනි කවුළු පද්ධතියක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. මෙය ජාතික ප්‍රමුඛතා ව්‍යාපෘතියක් ලෙස පිළිගෙන තිබෙන අතර, එය ජාත්‍යන්තර වෙළඳ ප්‍රවාහයන්ට සම්බන්ධ සියලුම නියාමන පියවර සහ ආයතන, එක් අන්තර් සම්බන්ධිත වේදිකාවකට ගෙන ඒමෙන්, දේශසීමා වෙළඳාමෙහි (ආනයන, අපනයන සහ ප්‍රතිනැව්ගත කිරීම) නියැලී සිටින වෙළඳුන් හට අවශ්‍ය සියලුම ලියකියවිලි තනි පිවිසුම් ස්ථානයක ඉදිරිපත් කිරීමට සහ ඔවුන්ට අවශ්‍ය නිසි ප්‍රතිඵල ස්වයංක්‍රීයවම ඒ හරහා ලබා ගැනීමට සැලසුම් කරමින් පවතී.

**ඒ අනුව, වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතියේ හි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ පහත සඳහන් තනතුරු පිරවීම සඳහා වඩාත් සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.**

## 1) පාර්ශවකරුවන්ගේ සන්නිවේදන සහ අලෙවිකරණ නිළධාරි (PS 6 A) - තනතුරු 01

### සුදුසුකම් සහ පළපුරුද්ද

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම ආයතනයකින් ලබාගත් සන්නිවේදනය, අලෙවිකරණය හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයක උපාධිය:

**හෝ**

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්:

**හෝ**

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීය සුදුසුකමක්:

**හෝ**

- තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු සහතිකයක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 1 පළපුරුද්දක් තිබීම

**හෝ**

**ආ)** තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු සහතිකයක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 6 පළපුරුද්දක් තිබීම.

**හෝ**

ඇ) තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 නොඅඩු සහතිකයක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 11 පළපුරුද්දක් තිබීම.

## 2) කොන්ත්‍රාත් නිළධාරි (PS 6B) - තනතුරු 01

### සුදුසුකම් සහ පළපුරුද්ද

අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම ආයතනයකින් ලබාගත් ව්‍යාපාර, ආර්ථික විද්‍යාව, සැපයුම්දාම කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය හෝ අදාල ක්ෂේත්‍රයක් පිළිබඳ උපාධියක්:

**හෝ**

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් තිබීම.

**හෝ**

- තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු සහතිකයක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 1 පළපුරුද්දක් තිබීම

**හෝ**

- තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු සහතිකයක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 4 පළපුරුද්දක් තිබීම

**හෝ**

- තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු සහතිකයක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 9 පළපුරුද්දක් තිබීම

## පොදු කොන්දේසි:

- **2025/11/03** වැනි දිනට වයස අවුරුදු 55 නොවැඩි විය යුතුයි.
- වාර්ෂික කාර්යසාධක ඇගයුම මත පදනම්ව වාර්ෂිකව කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට යටත්ව, මාස 22 ක කාලසීමාව සඳහා අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලැබේ.
- **2025/11/03** වැනි දිනට හෝ ඊට පෙර අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරාලිය යුතු ය.
- වැටුප සම්බන්ධයෙන් සාකච්ඡා කර එකඟතාවයකට පැමිණිය හැකි අතර අනෙකුත් ප්‍රතිලාභ 2019 මාර්තු මස 05 දිනැති චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධාන පරිදි තනතුරට අදාළ PS කාණ්ඩයට අනුව හිමි වේ.
- මෙහි සඳහන් නොවූ යම් කරුණක් හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලිය අතර මතුවූ ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් හා එකම තීරණය වේ.
- පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සතුය.

## අයදුම්කිරීමේ ක්‍රමවේදය:

සියලුම අයදුම්කරුවන් තම ජීව දත්ත පත්‍රිකාව සමඟ ඥාතීන් නොවන තමා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි පුද්ගලයන් දෙදෙනෙකු (අවසන්වරට සේවය කල සේවා යෝජකයින් දෙදෙනාගෙන් විය යුතුය.) සහ සහතිකපත්වල සහතික කළ පිටපත් 2025/11/03 දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් පහත දක්වා ඇති ලිපිනයට යොමු කළ යුතුය. දැනට රජයේ / අර්ධ රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා යොමු කල යුතුය. අයදුම්පත අඩංගු කවරයේ ඉහළ වම් කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුයි.

**ලිපිනය:**

වැඩසටහන් අධ්‍යක්ෂ<br>
වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය<br>
03 වන මහල , "ලෝටස් ගොඩනැගිල්ල"<br>
අරලියගහ මන්දිරය<br>
කොළඹ 03

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර අසම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම හෝ අවශ්‍ය සියලුම ලේඛන ඉදිරිපත් නොකිරීම සුදුසුකම් නොලැබීමට හේතුවක් වනු ඇත.

තනතුරු පිළිබඳ විස්තර ඇතුළුව වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර මෙම වෙබ් අඩවිය වෙත පිවිසෙන්න **www.onetrade.lk**

**ලේකම්:**<br>
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**<br>
**මහ ලේකම් කාර්යාලය**<br>
**කොළඹ** 01

**දිනය:** 2025/10/19